# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 2033/48 - 2017 අගෝස්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත් කිරීම්

උතුරු පළාතේ ආණ්ඩුකාරවර රෙජිනෝල්ඩ් කුරේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154ඊ (1), (4) සහ (5) වැනි වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත සඳහන් පත් කිරීම් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | |
|---|---|
| විනිසුරු කනගසභාපති විශ්වලිංගම් විග්නේශ්වරන් මැතිතුමා | උතුරු පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, පළාත් පාලන, පළාත් පරිපාලන, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන, මෝටර් රථ ප්‍රවාහන හා ප්‍රවාහන අමාත්‍යවරයා වශයෙන් 2017ක් වූ අගෝස්තු මස 23 වැනි දින සිට. |
| අනන්ති සසිදරන් මහත්මිය | උතුරු පළාත් කාන්තා කටයුතු, පුනරුත්ථාපන, සමාජ සේවා, සමූපකාර, ආහාර සැපයුම් හා බෙද හැරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන සහ වෙළඳ හා වාණිජ්‍ය අමාත්‍යවරයා වශයෙන් 2017ක් වූ අගෝස්තු මස 23 වැනි දින සිට. |
| වෛද්‍ය ආචාර්ය ඥාණසීලන් ගුණසීලන් මැතිතුමා | උතුරු පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යවරයා වශයෙන් 2017ක් වූ අගෝස්තු මස 23 වැනි දින සිට. |
| කන්දයියා සිවනේසන් මැතිතුමා | උතුරු පළාත් කෘෂිකර්ම හා ගොවිජන සේවා, සත්ව පාලන, වාරිමාර්ග, ධීවර, ජල සම්පාදන හා පරිසර අමාත්‍යවරයා වශයෙන් 2017ක් වූ අගෝස්තු මස 23 වැනි දින සිට. |

රෙජිනෝල්ඩ් කුරේ,
ආණ්ඩුකාරවර,
උතුරු පළාත.

2017 අගෝස්තු මස 23 වැනි දින.

09-138


1A - PG 3666 — 57 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*